**ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනය - 2019**

**----------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**-----------------------------**

ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනයේ 2019 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශය, සමුච්චිත අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සම්මේලනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**----------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ විගණන විෂය පථය යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**---------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සම්මේලනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සම්මේලනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සම්මේලනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සම්මේලනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සම්මේලනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

---------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සම්මේලනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරන ඇස්තමේන්තු වල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සම්මේලනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සම්මේලනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සම්මේලනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සම්මේලනයේ ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ජංගම නොවන වත්කම් සඳහා ඵලදායි ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවති රු.536,252 ක් වූ ලී බඩු, කාර්යාලීය උපකරණ හා ක්‍රීඩා උපකරණ සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද, ඇස්තමේන්තු ගත දෝෂය ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | 2020 වර්ෂය තුළදී ඇස්තමේන්තුගත දෝෂය ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කරමි | සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද උපකරණවල ඵලදායි ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කළ යුතුය. |
| (ආ) කාර්යාලීය උපකරණ හා ක්‍රීඩා උපකරණ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ක්ෂය රු.187,699 ක් වැඩියෙන් දක්වා තිබුණු අතර ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය එම වටිනාකමෙන් වැඩියෙන්ද ස්ථාවර වත්කම්වල ශුද්ධ අගය එම වටිනාකමෙන් අඩුවෙන්ද දැක්වුණි. | 2020 වර්ෂයේදී පූර්ව වර්ෂ ගැලපීම් ලෙස සටහන් කිරීමට කටයුතු කරමි. | ස්ථාවර වත්කම් වල පිරිවැය වටිනාකම හා ක්ෂය වටිනාකම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) 2019 වර්ෂයේ පැවැත්වීමට නියමිතව තිබී 2020 වර්ෂයේ පවත්වා තිබුණු ක්‍රීඩා තරඟ සඳහා 2020 වර්ෂයේදී වැයකර තිබුණු රු.6,875,000 ක් සමාලෝචිත වර්ෂයේ ක්‍රීඩා තරඟ වියදම් ලෙසද එම තරඟ සඳහා 2020 වර්ෂයේ ලද අනුග්‍රාහක ආදායම් රු.3,250,000 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙසද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2020 වර්ෂයේ ලද රු.3,250,000 ක මුදල 2019 වර්ෂය වෙනුවෙන් ලද මුදලක් බැවින් ලැබිය යුතු අනුග්‍රාහක ආදායම් ලෙස ගිණුම් ගත කර තිබූ අතර එය 2020 වර්ෂයේ අනුග්‍රාහක ආදායම් නොවන බව දන්වා සිටිමි. | අදාළ වර්ෂයේ පවත්වන ලද තරඟාවලි සඳහා වන වියදම් පමණක් එම වර්ෂයට අදාළව ගිණුම්ගත කළ යුතුය. |

## 1.5.2 නොසැසඳුනු පාලන ගිණුම්

| විෂය | මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය රු. | අනුරූපී වාර්තා අනුව ශේෂය රු. | වෙනස රු. | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණයට ගෙවිය යුතු ගිණුම් | 987,449 | 1,210,416 | 222,967 | ගිණුම් ප්‍රකාශය අනුව රු.987,449 ක මුදල පමණක් සම්මේලනය වෙත වාර්තා වී ඇති බව දන්වා සිටිමු. | නොසැසඳුනු ශේෂයන් හඳුනාගෙන නිවැරදිව ගිණුම්වල ගැලපීම් කල යුතුය. |

**1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

පහත සඳහන් ගිණුම් විෂයන්ට අදාළව ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට හෝ නොහැකි විය.

| | විෂය | වටිනාකම | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | ක්‍රීඩා තරඟාවලි වියදම් | 7,377,619 | වියදම් විස්තර, අනුමත ඇස්තමේන්තු, බිල්පත් සහ මුදල් ලබාගත් බවට ලදුපත් | ඇස්තමේන්තු සහ වියදම් විස්තර ලබාදීමට කටයුතු කරමි | වත්කම්, ආදායම් හා වියදම් සනාථ කර ගැනීමට අවශ්‍ය ප්‍රමාණවත් හා යෝග්‍ය විගණන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වීම |
| (ආ) | අනුග්‍රාහක ආදායම් | 19,139,800 | අනුග්‍රාහක ගිවිසුම් | 2020 වර්ෂයේදී අදාළ ගිවිසුම් ලබා ගැනීමට කටයුතු කරමි | |
| (ඇ) | ආදායම් | 94,000 | ලදුපත් | 2020 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි | |
| (ඈ) | විවිධ වත්කම් | 16,150 | උපලේඛන | 2020 වර්ෂයේදී සමාලෝචනය කර ඉදිරිපත් කරමි | |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය ආයතන දෙකක් වෙත ගෙවිය යුතු එකතුව රු.2,987,449 ක් වර්ෂ 05 ක කාලයක සිට සහ රු.5,000 ක් වූ උපචිත වියදම් ශේෂයක් වර්ෂ 3 ක කාලයක සිට නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | එකඟ වෙමි | ගෙවිය යුතු ගිණුම් අප්‍රමාදව නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.8,060,258 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.3,332,963 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,727,295 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙහෙයුම් ආදායම් රු.26,801,251 කින් අඩුවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 3.1 ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝග 7 (xii) අනුව, සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර නොතිබුණි. | එකඟ වෙමි | ජාතික ක්‍රීඩා සංගම් නියෝගවල දැක්වෙන පරිදි වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කළ යුතුය. |

### 3.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ සම්මේලනයේ රු.මිලියන 62.2 ක ආදායමක් හා රු.මිලියන 70.3 ක වියදමක් පැවති අතර 2019 දෙසැම්බර් 31 දිනට මුළු වත්කම්වල එකතුව රු.මිලියන 5.5 ක් විය. එසේ වුවත් සම්මේලනයේ කටයුතු පිළිබඳව අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කිරිම සම්බන්ධව පාලක මණ්ඩලය අවධානය යොමුකර නොතිබුණි . | එකඟ වෙමි | සම්මේලනයේ ගණුදෙනු සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකල යුතුවීම. |